**ශ්‍රී ලංකා කජු සංස්ථාව - 2022**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි 15 වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් විලම්භිත බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි.<br><br>විලම්බිත බදු ගැලපීම් 2023 මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව විලම්භිත බදු ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු. 133,557,771 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර එම වත්කම්වල ඵලදායි ජීවිතකාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. සම්පූර්ණයෙන් ක්ෂය වූ නැතහොත් ධාරණ අගය ශුන්‍යව පවතින ස්පෘශ්‍ය ජංගම නොවන වත්කම් (දේපළ, පිරියත හා උපකරණ) ඇතුළුව සංස්ථාවේ සියලුම ස්පෘශ්‍ය ජංගම නොවන වත්කම්වල අගය නැවත තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. එසේම මෝටර් වාහන හැර අනෙකුත් ස්පෘශ්‍ය ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් විධිමත් පරිදි සමීක්ෂණයක් සිදුකොට නැවත තක්සේරු කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම්වල ඵලදායි ජීවිතකාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ වල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 133,557,771 ක් වූ දේපල, පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. වත්කම්වල අගය නැවත තක්සේරු කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමත් සමඟම මෙම විගණන නිරීක්ෂණයෙහි සඳහන් වත්කම්වල දළ ධාරණ අගයන් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 139 වැනි වගන්තිය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට | නිරීක්ෂණය හා එකඟ වෙමි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂයට අනුරූපිව මාසිකව රු. 100,000 ක් බැගින් වන සේ ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය හා විෂයභාර | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ රු. 35,789,916 ක ශේෂයට අනුරූපීව කිසිදු ආයෝජනයක් සිදු කර නොතිබුණි. | අමාත්‍යතුමාගේ අනුමැතිය ද සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර, ඒ අනුව අදාල අනුමැතිය ලද වහාම අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 135 (ආ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරිමක් ඉදිරිපත් කර නොතිබුණි. සංස්ථාව විසින් එහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලී ආදායම හෝ වියදම, සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කරන ලද ගෙවීම් සහ ආයුගණන ප්‍රතිලාභ ලාභය/අලාභය යනාදී අයිතමයන් වෙන් වශයෙන් දැක්විය යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාල සටහනෙහි එහි එකතුව වර්ෂය සඳහා වියදම් ලෙස පෙන්වා තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළයුතු තොරතුරු 2023 වර්ෂයේ සිට අදාල ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂය දක්වා සංසන්දනයක් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සංස්ථාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම වතුයායේ 2000 වර්ෂයේදී වගා කරන ලද තේක්ක පැළ 2022 වර්ෂය වන විට දැව ලබා ගැනීමේ තත්ත්වය දක්වා වර්ධනය වී ඇති ගස් ප්‍රමාණය 3,350 ක් පමණ වුවද, එම ගස්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | එළුවන්කුලම වතුයායේ තේක්ක ගස් තක්සේරු කිරීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇති අතර, එම තක්සේරුවේ නිරවද්‍යභාවය තහවුරු කර ගැනීම සඳහා අදාල තක්සේරු වාර්තාව රාජ්‍ය දැව සංස්ථාව වෙත යොමු කර ඇත. කෙසේ නමුත්, එම වතුයායේ නීතිමය අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති හෙයින් එම තේක්ක ගස්වල තක්සේරු වටිනාකම සංස්ථාවේ ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමේ හැකියාවක් නොමැත. | ගස්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දෘෂ්‍ය අලාභය රු.134,800,425 සිට රු.102,312,523 දක්වා පරාසයක් ගෙන තිබුණි. මේ අනුව සංස්ථාවේ අඛණ්ඩ මෙහෙයුම් අලාභ, කාර්යමණ්ඩල පුරප්පාඩු , පවත්නා කප්‍රු වතු උපරීම ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම වැනි හේතු මත රජයේ ප්‍රදාන නොමැතිව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අභියෝගාත්මක වී ඇති බව නිරීක්ෂණය විය. | සංස්ථාවේ විකුණුම් හා අනෙකුත් ආදායම් තවදුරටත් ඉහළ නංවා ගනිමින් හා වියදම් නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් ලාභදායීත්වය වර්ධනය කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අලාභ,කාර්ය මණ්ඩල පුරප්පාඩු හා වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම කෙරෙහි අවධානයෙන් කටයුතු කර සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ ණය අයකරගැනීමේ කාලසීමාව දින 60 ක් වුවද දින 90 ඉක්මවූ වෙළෙඳ ණයගැති ශේෂය රු.2,994,271 කි. එම ශේෂය තුළ ඇතුළත් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට පවතින, කොළඹ ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු. 1,499,410 ක ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සහන කාලසීමාව ඉක්මවූ රු.2,994,271 ක වෙළෙඳ ණයගැති ශේෂයෙන් 2023.09.30 දින වනවිට රු. 1,296,771 ක් අය කර ඉතිරි ශේෂයන් ද කඩිනමින් අයකරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.රු. 1,499,410 ක ණයගැති ශේෂය (ලිසල එන්ටප්‍රයිසස් ආයතනය) අයකරවා ගැනීමට දීර්ඝ කාලයක් පුරා ගත් උත්සාහය ව්‍යර්ථ වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට යොමු කර ඇත. | ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට රු.9,466,200 ක කප්‍රු පැළ ලබාදී වසර 10 ක් ගත වී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිකම නිරීක්ෂණය කෙරේ. | වර්තමානයේ අහෝසි වී ඇති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවීමට ඇති රු. 9,466,200 ක ණයගැති ශේෂය හා මෙම සංස්ථාව මඟින් රජයේ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව පවතින රු. 3,500,000 ක ණය ශේෂයට සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් අදාල හිලව් කිරීම සඳහා ඉඩප්‍රස්ථාවක් නොමැති බවත්, ඉහත අයවිය යුතු ණයගැති ශේෂය සම්බන්ධව සංස්ථාවේ විගණන කමිටුවෙහි නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලිඛිත උපදෙස් ලැබී ඇත. | ලැබිය යුතු ගිණුම් ශේෂ සම්බන්ධයෙන් නොපමාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ 01 කට වඩා වැඩි වෙනත් ණයගැති වටිනාකම රු.18,857,611 ක් වුවද වෙනත් ණයගැති සඳහා වෙන් කරන ලද හානිකරණ අලාභය රු.2,106,184 කි. 2018 වර්ෂයේ සිට වෙනත් ණයගැතියන් සඳහා හානිකරණ අලාභ ලෙස සෑම වර්ෂයකම එකම අගයක් පවත්වා ඇතත් එම අගය වාර්ෂිකව යාවත්කාලීන කිරීමක් හෝ අගයන් කපාහැරීමක් හෝ වෙනත් පියවරක් ගෙන නොතිබුණි. | හානිකරන අලාභ වෙන්කිරීමක් සිදුකර නොමැති ද්‍රව්‍යාත්මක ණයගැති ශේෂ සම්බන්ධයෙන් ද අවධානය යොමු කර වර්තමාන හානිකරන අලාභ වෙන්කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාල පරිදි ගිණුම් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | හානිකරණ අලාභ සඳහා වන වෙන්කිරීම වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එවකට පැවති සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ලෙලි කපු මිලදී ගැනිම සඳහා 2005 වර්ෂයේදී ආපසු ගෙවීමේ පදනම මත වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් රු.3,500,000 ක් හා ඊට අදාළ පොලිය වන රු. 927,500 ක මුදල සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් ණය මුදල, සංස්ථාව ලැබිය යුතුව පවතින රාජ්‍ය ණය මුදල්වලට එරෙහිව හිලව් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කළ ද ඒ සඳහා අනුමැතිය හිමිවී නොමැත. මෙම ගෙවිය යුතු ණය වටිනාකම සම්බන්ධයෙන් සාකච්ඡා කර නිගමනයකට පැමිණීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථා සේවකයින් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන රක්ෂණාවරණය මඟින් සේවකයින්ට ගෙවිය යුතු සේවකයින්ගේ වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණයට වර්ෂ 02 කට පෙර ගෙවීමට නියමිතව තිබුණු රු.1,300,431 ක් හා වර්ෂයකට පෙර ගෙවීම සඳහා නියමිතව තිබුණු රු.2,653,907 ක් ලෙස එකතුව රු.3,954,338 ක් අදාළ ප්‍රතිලාභින්ට නොගෙවා ගෙවිය යුතු ණයහිමි ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023.11.30 දින වනවිට රු .1,834,738 ක මුදලක් අදාල කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවීම් කර ඇති අතර ගෙවීමට ඉතිරිව පවතින අගය රු.2,119,600 කි. මෙම වෛද්‍යාධාර මුදල් ගෙවීම් සිදුකරනු ලබන්නේ සංස්ථාව මඟින් ඉපයූ අරමුදල්වලින් වන බැවින් පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන අදාල ගෙවීම් ප්‍රමාද වී ඇත. සංස්ථාවේ මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු ඉතිරි මුදල් ගෙවනු ලැබේ. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2011 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබුණි. එහෙත් මූල්‍ය ප්‍රකාශන වල එම කාලපරිච්ඡේදවලට අදාළව රු.779,483 ක රඳවාගත් බදු (WHT) ලැබිය යුතු ශේෂයක් පෙන්නුම් කර තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. මේ වනවිට අදාල ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කරගෙන යනු ලබන අතර,සැලකිය යුතු වර්ෂ ගණනක ආදායම් බදු වාර්තා ද පිළියෙල කිරීමට පවතින බැවින් ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවේ. ඒ අනුව හැකි ඉක්මණින් අදාල කටයුතු සම්පූර්ණ කර එම වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | අදාල ආදායම් බදු වාර්තා පිළියෙල කර, ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය | ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් 2023 ජුනි 23 දිනට විගණන ගාස්තුව වූ රු.930,000 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවීමට ඇති ඉතිරි මුදල ද හැකි ඉක්මණින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | හිග විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ | සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද ,2012 ජුලි 24 දිනට පෙර සහ 2012 ජුලි 24 දිනට පසු සංස්ථාව භුක්ති විඳින ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබාදී ඇති ඉඩම් අක්කර 11,363 ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාළ කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි. | 2012 ජුලි මස 24 වන දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ලැබෙන අවස්ථාව වනවිට සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරාගෙන නොමැති වතුයායන්/ බීජ උද්‍යානයන් හි ඉඩම් අක්කර ප්‍රමාණය අක්කර 2370 ක් පමණකි.2012 වර්ෂය වනවිට මෙම සංස්ථාවට අයත්ව නොතිබූ එහෙත් පසුකාලීනව විවිධ පාර්ශව වෙතින් සංස්ථාව වෙත ලැබී ඇති නමුත් මෙතෙක් නීතිමය අයිතිය පවරාගෙන නොමැති ඉඩම් අක්කර ප්‍රමාණය 8993 කි.ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. | කාරක සභා තීරණ පරිදි නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතෙහි 66 ඡේදය | මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, විගණකාධිපතිට ද පිටපත් සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2023 සැප්තැම්බර් 12 දිනදීය. | නිරීක්ෂණය හා එකඟ වෙමි. විවිධ ප්‍රායෝගික හේතූන් මත පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රමාදයන් මඟහරවාගෙන 2022 වර්ෂය තෙක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර, 2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පිළියෙල කර අදාල රාජ්‍ය ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරීන්ගේ හා සේවකයින්ගේ වෘත්තීය සමිති හා සුභසාධක සංගම්වල දායක මුදල ලෙස වැටුපෙන් අඩු කළ රු.1,807,121 ක වාරික මුදල් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම සංගම්වලට බැර නොකර සංස්ථාවේ ගිණුමේ රඳවාගෙන තිබුණි. | රු.1,807,121 ක වාරික මුදලින් රු.1,681,598 ක මුදලක් අදාල සංගම් වෙත ගෙවා ඇත. සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන මෙහි සඳහන් තත්ත්වය උද්ගතවූ අතර, කෙසේ නමුත් ඉදිරියේදී මෙම වැටුපෙන් සිදුකරන අවකරණයන් අදාල අවස්ථාවේදීම එම සංගම් වෙත ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | නිලධාරීන්ගේ හා සේවකයින්ගේ සංගම් වෙත ගෙවිය යුතු මුදල් සංස්ථාවේ කාර්යයන් සඳහා භාවිතා නොකළ යුතුය. |
| (ආ) | කොන්ඩච්චි වතුයාය ප්‍රතිසංස්කරණය යටතේ අලි වැට ඉදිකිරීම, ට්‍රැක්ටර් හා ජල බවුසර් මිලදී ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම යන ප්‍රධාන කාර්යයන් සඳහා උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්,කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද රු.225,000,000 ක මුදලින් 2022 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව ලෙලි කජු මිලදී ගැනීම සඳහා රු.9,000,000 ක් භාවිතා කර තිබුණි. | කොන්ඩච්චි වතුයායේ පවතින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන කජු වගා කොටසෙන් ලැබෙන ලෙලි කජු අස්වනු, කැබිනට් මණ්ඩලයේ තීරණයකට අනුව මෙම සංස්ථාව වෙත මිලදී ගැනීමට බැඳියාවක් පවතින බැවින් 2022 වර්ෂය තුළදී එම දෙපාර්තමේන්තුව විසින් ඉහත පරිදි එක්රැස් කොටගෙන තිබූ ලෙලි කජු අස්වනු මිලදී ගැනීම සඳහා මෙම රු.9,000,000 ක මුදල අදාල ප්‍රතිස්ථාපන ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් භාවිතා කර ඇති නමුත් මේවනවිට එම මුදල් නැවත ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය වෙත පියවීම සිදුකර ඇත. | ව්‍යාපෘතියකට වෙන්කළ මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. රු.14,471,411 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 16,412,185 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,883,596 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන ප්‍රදාන රු.12,700,000කින් හා ආදායම ලෙස හඳුනාගත් මූලධන ප්‍රදාන රු.11,085,762 ක ප්‍රමාණයකින් වැඩිවීම, මන්නාරම දිස්ත්‍රික්කයේ කොන්ඩච්චි වතුයායේ අතුරුබෝග වගාව තුළින් වර්ෂය තුළ රු.6,437,392 ක ආදායමක් ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇතත් වර්ෂය තුල කජු නිෂ්පාදන විකුණුම් ආදායම, පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3.1 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෙලි කජු, කජු මද හා කජු පැළ ඒකක පිරිවැය ගණනයේදි නිවැරදි පිළිගත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් ගිණුම් වාර්තාවල දක්වා තිබෙන රු. 72,093,677 ක් වූ අවසන් තොග වටිනාකම නිවැරදිතාවය පරීක්‍ෂා කළ නොහැකි විය. | සංස්ථා නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් මේවනවිට මෙහි සඳහන් පිරිවැය ගණනය කිරීම්වල මූලික කටයුතු සම්පූර්ණ කර ඇත. ඒ අනුව හැකි ඉක්මණින් අදාල පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදය සම්පූර්ණ කර, ඒ සඳහා ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගෙන් එකඟතාවය ලබා ගනිමින්,2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල ක්‍රමවේදය උපයෝගී කොටගෙන අවසන් තොගවල වටිනාකම් ගණනය කර එම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිෂ්පාදන පිරිවැය වෙන වෙනම ගණනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) | සංස්ථාව පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අංක 60/07 හා 1973 මැයි 25 දිනැති ගැසට් නිවේදනයේ පළමු උපලේඛනයේ (අ), (ඇ), (ඈ) (ඊ) සහ (ඌ) වගන්තිවල සඳහන් කරුණු ඉටුකර ගැනීම කෙරෙහි 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ඉතා අඩු අවධානයක් යොමුවී තිබූ අතර එනම් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම, අලෙවිය හා අපනයනය දියුණු කිරිම, ප්‍රසිද්ධ කිරිම හා බෙදා හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් සමඟ එක්ව කටයුතු කිරිම සහ විමර්ශන හා පර්යේෂණ කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ නොවෙමි.<br>අදාල තොරතුරු හා උපදෙස් ලබාදීමේදී විෂයභාර අමාත්‍යාංශය (වර්තමානයේදී කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) මගින් අදාල තොරතුරු සංස්ථාව මගින් ඉල්ලුම් කරනු ලබන අතර, සංස්ථාව මගින් එම තොරතුරු ලබාදෙනු ලැබේ.<br>ඊට අමතරව පැන නඟිනු ලබන හදිසි, විශේෂ හා අනෙකුත් විෂයානුබද්ධ කරුණුවලදී විෂයභාර අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන රැස්වීම්වලදී විෂය සම්බන්ධ නිලධාරීන් විසින් ඔවුන්ගේ අදහස්, අදාල තොරතුරු හා විශේෂඥ මත ඉදිරිපත් කරනු ලැබේ. සංස්ථාව විසින් මැදිහත්විය යුතු එහි මූලික පරමාර්ථවලින් පරිබාහිර කරුණුවලදී ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්තුමා අනුමැතියට අනුව අදාල කටයුතු සිදුකරනු ලැබේ. | ආයතනය ස්ථාපනය කල අරමුණු ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සංස්ථාව සතුව/භාරයේ පවතින වතු 13 ක ඉඩම්වල ප්‍රමාණය අක්කර 11,363 ක් වූ අතර ඉන් අක්කර 3,449 ක කජු වගා කර තිබූ අතර, කජු වගා නොකල ඉඩම්වල ප්‍රතිශතය සියයට 70 ක් වී තිබුණි. එම හිස් ඉඩම් වගාකිරීම සඳහා සංස්ථාව විසින් ඵලදායි පියවර ගෙන නොතිබුණි. | සංස්ථාව ආරම්භ කර වසර 50 ක කාලයක් ඉක්මගොස් තිබුන ද මුළු ඉඩම් අක්කර 11,363 ක ප්‍රමාණයෙන් සියයට 79 ක්ම මෙම සංස්ථාව වෙත හිමිවී ඇත්තේ 2012 වර්ෂයෙන් පසුව වේ.මුළු ඉඩම් ප්‍රමාණයෙන් මන්නාරම කොන්ඩච්චි වතුයාය හා මඩකලපුව මාන්කර්නි වතුයාය සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත කජු වගාව සඳහා ලබාදී අක්කර 1600 ක භූමි කොටස්වල සාර්ථක ලෙස කජු වගාකර ඇත. එසේම කජු වගාව හෝ වෙනත් වගාවක් සිදුකළ නොහැකි අක්කර 552 ක භූමි ප්‍රමාණයක් ද පවතී. | සංස්ථාව විසින් වගා නොකල හිස් ඉඩම් වගාකිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඈ) | සංස්ථාව කජු වගාකල ඉඩම් අක්කර 3,449 ක බද්ධ කජු පැල අක්කරයකට 70 ක් හා බීජ කජු පැල අක්කරයකට 40 බැගින් වගා කිරීමෙන් 2022 වර්ෂයේදී කජු ඵලදාව මෙට්‍රික් ටොන් 88.24 ක් වුයෙන් අක්කරයක අස්වැන්න කජු කි.ග්‍රෑම් 25.38 ක අඩු අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එම වතුවල ඵල දරන කජු ගස් ප්‍රමාණය 51,685 ක් ලෙස දක්වා තිබූ අතර ඒ අනුව එක් කජු ගසක සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 1.71 ක් වැනි දූර්වල තත්ත්වයක පැවතුණි. | සංස්ථා වතුයායන් බොහොමයක ඉතා පැරණි කජු වගා පවතින අතර, එම පවතින කජු ගස් ප්‍රමාණය සම්මත කජු ගස් ගණනට වඩා බෙහෙවින් පහළ අගයක් ගනී. එමෙන්ම වන අලි හානිය, කඳ හා මුල් විදින කුරුමිණි හානිය වැනි හේතූන් නිසා ද කජු ගස් ප්‍රමාණය විශාල වශයෙන් අඩුවීමකට ලක්වී ඇත. 2022 වර්ෂයේදී පැවති කජු වගාවට අහිතකර කාලගුණික හා දේශගුණික තත්ත්වයන් හේතුකොටගෙන සමස්ත දිවයිනෙහිම ලෙලි කජු අස්වනු පහළ මට්ටමක පැවති අතර, 2020 වර්ෂය තුළදී මෙම සංස්ථාවේ වතුයායන් මඟින් එක්රුස් කරගත් ලෙලි කජු අස්වැන්න කි.ග්‍රෑම් 5.043කට ආසන්න අගයක පැවතිණි. | කජු ඵලදාව පිළිගත නොහැකි මට්ටමේ අඩුවීමක් වාර්තා වී ඇති අතර කජු අස්වැන්න වර්ධනයට පියවර ගත යුතුය. කජු වතු පාලනය හා අස්වනු නෙළීම පිළිබඳ මනා අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | සංස්ථාව සතු පුත්තලම කමන්දළුව හා අම්පාර හාඩි වතුවල පොල්ගස් සංඛ්‍යාව පිළිවෙලින් 3,358 ක් හා 826 ක් වූ අතර, නොමේරු 1,147 , ඵලදා ලබන 2,391 ක් හා කනාටු 646 ක් ලෙස සමන්විත වී තිබුණි. 2022 වර්ෂයේ පොල් ඵලදාව ගෙඩි 90,304 ක් වූ අතර එහි විකුණුම් ආදායම රු. 4,427,439 ක් වී තිබුණි. ඒ අනුව ගසක වාර්ෂික පොල් ඵලදාව ගෙඩි 38 ක් වූ අතර විකුණුම් ආදායම රු. 1,863 ක් දක්වා අඩු වීමට පොල් ගස් නඩත්තු කිරීම, පොහොර යෙදීම දූර්වල මට්ටමක පැවතිණි. | රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වය හා සංස්ථාවේ අයහපත් මූල්‍ය තත්ත්වයට අනුව පසුගිය ආසන්න වර්ෂ 05 ක පමණ කාලයක් පුරා පොල් වගාවට අවශ්‍ය රසායනික පොහොර නොයෙදීම නිසා අස්වනු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත.ප්‍රවර්තන වර්ෂයේදී පොල් වගාව සඳහා පොහොර මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින හෙයින් ඉදිරි වර්ෂවලදී පොල් අස්වනුවල සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කළ හැකිය. | පොල් ඵලදාව වර්ධනය කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ලෙලි කජු ගබඩාව වර්ෂ ගණනාවකින් අලුත්වැඩියා කර නොතිබුණු අතර ගබඩාවේ ලෙලි කජු ගබඩා කිරීමේදී, ලෙලි කජු වලට වාතාශ්‍රය ලැබෙන පරිදි ලණු ගෝනි හෝ දැල් ගෝනි භාවිතා නොකර පොලිසැක්ස් වර්ගයේ ඇසුරුම් භාවිතා කිරීම හේතුවෙන් හොඳ තත්ත්වයේ පවතින ලෙලි කජු නරක් වීම සිදුවී තිබුණි. | නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය ඉතා පැරණි ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර පිරිසැකසුම් අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නවීකරණය අපහසු කටයුත්තකි. පැරණි ගොඩනැගිල්ල ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් මෙම ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගත හැකි නමුත් ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන සංස්ථාව සතුව නොමැත.<br>එමෙන්ම වාර්ෂික ලෙලි කජු අස්වනු පිරිසැකසුම් කටයුතු සඳහා නැදගමුව හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථාන වෙත එවනු ලබයි. එම තොග ඇසිරීම සඳහා ලණු ගෝනි ඉතාමත් ඉක්මණින් දිරා යැමට ලක් වන බැවින් ලෙලි කජු තොග පොලිසැක් ඇසුරුම් භාවිතා කරනු ලැබේ. | අපතයන් අවම කිරීමට පියවර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කජු වගා කර තිබෙන බිම් ප්‍රමාණය දළ වශයෙන් අක්කර 3,449 ක් වී තිබුණි. එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු. 24,159,359 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද එම කජු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි. | මෙම කජු ගස් සංගණනය කිරීමේ මූලික කටයුතු මේවනවිට ආරම්භ කර ඇති අතර, එළඹෙන වර්ෂයේ අස්වනු සමයට පෙර එම කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. අදාල සංගණන කටයුතු නිම කිරීමෙන් පසුව ඒ මත පදනම්ව කජු ගස් රෙජිස්තරය පිළියෙල කිරීමේ කටයුතු ද සම්පූර්ණ කරනු ලැබේ. | වත්කම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව සතුව බැංකු ජංගම ගිණුම් 06 ක් හා ඉතිරිකිරීමේ බැංකු ගිණුම් 05 ක් පැවති අතර ඉන් ජංගම ගිණුම් 02 ක් හා ඉතිරිකිරීමේ ගිණුම් 03 ක් දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක වී නොමැති අතර ඒවායේ එකතුව පිළිවෙලින් රු. 23,343 ක් හා රු.306,966 ක් විය. එම අක්‍රිය ගිණුම් 05 වසා දැමීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | මේ වනවිට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන, ලංකා බැංකුවේ ජංගම ගිණුම් 02 ක් (අංක 1633704 හා 1633705 දරණ ජංගම ගිණුම්) හා ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම් 01 ක් (අංක 1649789 දරණ ඉතිරි කිරීමේ ගිණුම) හැරුනුකොට සංස්ථාවේ ඉතිරි සියලුම බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. | අක්‍රිය බැංකු ගිණුම් වසා දැමීම කළ යුතුය. |
| (ආ) | උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් මන්නාරම, කොන්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය සඳහා අවස්ථා තුනකදී එකතුව රු.225,000,000 ක් ලබාදී | කොන්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපනය සඳහා ලැබී ඇති රු.225,000,000 ක ප්‍රතිපාදනවලින් 2023.10.31 දින වනවිට රු.89,428,585ක් අදාල ව්‍යාපෘති කාර්යයන් සඳහා වැය කර ඇත. එසේම 2023.10.31 දිනෙන් පසුව වතුයායේ නව කජු වගාව සිදුකරන භූමි කොටසේ කැළෑ එළිකිරීම හා වලවල් කැපීම, වතුයාය සඳහා | අරමුදල් ඵලදායිව හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

| | |
|---|---|
| 2021දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබුණද 2022 දෙසැම්බර් 31 වන විට රු.78,761,352 ක් වියදම් කර ශේෂය වූ රු.137,236,648 ක් නිෂ්කාර්ය ලෙස පැවතිණි. | කෘෂි උපකරණ, ක්ෂේත්‍ර උපකරණ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ වතුයායේ ඉදිකිරීමට නියමිත සංචාරක බංගලාව සඳහා විදුලි උපකරණ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම යන කාර්යයන්ට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකෙරෙමින් පවතින අතර, ඒ අනුව අවසාන අදියරෙහි පවතින එම ප්‍රසම්පාදන කටයුතු හරහා ඉදිරි කෙටිකාලසීමාව තුළදී තවදුරටත් වැය කිරීමට අපේක්ෂිත මුදල රු. 23,787,649 කි. අනෙකුත් ප්‍රධාන වැයකිරීම්වලට අදාල ප්‍රසම්පාදන කටයුතු ද ආරම්භ කර ඇති අතර, ඒ අනුව සැලසුම් කර ඇති පරිදි 2023.12.31 වන දිනට හෝ ඊට පෙර මෙම ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව සතු මෝටර් රථ 3 ක්, ලොරි රථ 2 ක්, ට්‍රැක්ටර් රථයක් හා මෝටර් සයිකල් 2 ක් 2023 නොවැම්බර් 30 දින වන විටත් අලුත් වැඩියා නොකර ගරාජවල ගාල් කර තිබුණි. | හදිසි අලුත්වැඩියා කටයුතු සංස්ථාවේ වාහන අලුත්වැඩියා ක්‍රමවේදයට අනුව සංස්ථාවේ වාහන ගරාජවලට ඇතුළත් කරන අතර, සමහර අවස්ථාවලදී හදිසියේ ගරාජවලට ඇතුළත් කරනු ලබන වාහනවල අලුත්වැඩියාවන්ට අදාල ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සම්පූර්ණ කරන තෙක් එම වාහන සැලකිය යුතු කාලසීමාවක් ගරාජ තුළ රැඳී පවතින අවස්ථා පවතී. කෙසේ නමුත් වාහන අලුත්වැඩියා ක්‍රමවේදය නිසි පරිදි අනුගමනය කරමින් හැකි ඉක්මණින් අදාල අලුත්වැඩියා නිම කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | අලුත්වැඩියා සිදුකර එම වත්කම් භාවිතයට පියවර ගත යුතුය. |
| (ආ) | පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ භෞතික තත්වය පරික්ෂාවේදී රු. මිලියන 7.092 ක් වැය කර කජු ස්වයංක්‍රීයව පිරිසැකසුම් කිරීම සඳහා 2021 වර්ෂයේ මිලදීගත් යන්ත්‍රය නිශ්කාර්ය වී තිබුණි. | රු.මිලියන 7.092 ක අගය තුළ මූලික වශයෙන් කජු බොයිලේරුවක්, කජු පිරිසැකසුම් යන්ත්‍රයක් හා කජු විජලන යන්ත්‍ර 02 ක් පැවති අතර, ඉන් සංස්ථාව මඟින් ඇණවුම් කරන ලද්දේ කජු පිරිසැකසුම් යන්ත්‍රය හා කජු විජලන යන්ත්‍ර දෙක පමණකි. පැවති උද්ධමනකාරී වාතාවරණය හේතුකොටගෙන කජු විජලන යන්ත්‍ර සැපයීම සිදුකළ නොහැකි බව අදාල සැපයුම්කරු වන සහේෂ් ඉන්ඩස්ට්‍රීස් ආයතනය විසින් දන්වා සංස්ථාව වෙත අදාල සැපයුම්කරු විසින් භාරදෙනු ලැබුවේ කජු පිරිසැකසුම් යන්ත්‍රය පමණි. එම පිරිසැකසුම් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පැවති ගැටළුසහගත තත්ත්වය භාවිතයට ගැනීම ප්‍රමාද විය. අදාල සැපයුම්කරු විසින් එම යන්ත්‍රය සඳහා ගෙවීම් ඉල්ලුම් කිරීමේදී, අදාල යන්ත්‍රයේ | අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කර එම යන්ත්‍ර භාවිතයට ගත යුතු අතර අලාභ අය කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත යන්ත්‍රයේ ගැනුම් මිලෙන් සියයට 10 ක අගයක් රඳවාගෙන අදාල ගෙවීම් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.<br>අනතුරුව මෙම යන්ත්‍රය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීම සඳහා කජු කැපීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍රය හිමි බුද්ධි ඉන්ඩස්ට්‍රීස් ආයතනය රු.මිලියන 04 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව දැනට ඉහත පිරිසැකසුම් යන්ත්‍රයේ අත්‍යාවශ්‍ය වන බවට හඳුනාගෙන ඇති කජු කැපීම සිදුකරන යන්ත්‍ර කොටස මූලික වශයෙන් අලුත්වැඩියා කර ගැනීමට මෙම සංස්ථාව අපේක්ෂා කරන අතර, ඒ අතරතුර ඉහත සඳහන් කළ පරිදි මූලික සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ. | |
| (ඇ) | නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින විදුලිජනක යන්ත්‍රය ,බොයිලේරුව ,කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින බොයිලේරුව අක්‍රිය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | විදුලිජනක යන්ත්‍රය හා බොයිලේරුව ඉතා පැරණි ඒවා වුව ද එම යන්ත්‍ර වරින්වර අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කටයුතු සඳහා භාවිතා කරන යන්ත්‍ර වේ.විවිධ ප්‍රායෝගික හේතූන් මත මේවායේ සමහර අලුත්වැඩියා කටයුතුවල යම් ප්‍රමාදයක් සිදුවී ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර කටයුතු කරනු ලැබේ. එසේම කජු ලෙලි තෙල් සඳහා වර්තමාන වෙළෙඳපොල ඉල්ලුමක් නොමැතිවීම හේතුකොටගෙන මෙම කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය භාවිතයට නොගෙන පවතී. කෙසේ නමුත් ඉදිරියේදී වෙළෙඳපොල සාධක වෙනසකට භාජනය වුවහොත් අවශ්‍යතාවය පරිදි සේවා කටයුතු සිදුකර මෙම යන්ත්‍රය නැවත අදාල නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට ගැනීමේ හැකියාව පවතී. | අලුත්වැඩියාවන් සිදු කර එම යන්ත්‍ර භාවිතයට ගත යුතුය. |
| (ඇ) | නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු පිරිසැකසුම් බොයිලේරුව 2015 වසරේ සිට ක්‍රියාවිරහිත වී කජු තැම්බීමේ ක්‍රියාවලිය නතරවීම හේතුවෙන් ලෙලි කජු තැම්බීමකට ලක්කර සියයට 90 ත් 95 ත් අතර ප්‍රමාණයෙන් ලබා ගත හැකිව තිබුණු නිෂ්පාදන ඵලදායිතාවය සියයට 70ත් 80ත් අතර ප්‍රමාණයක් දක්වා පහත වැටී තිබුණි. ඒ හේතුවෙන් කජු මද විකිණීමෙන් ලබාගත හැකිව | 2017 වර්ෂය මැද භාගයේදී පමණ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ බොයිලේරුව අලුත්වැඩියා කිරීම සඳහා මිල ලංසු කැඳවූ අතර එක් මිල ලංසුවක් පමණක් ලැබී ඇත. ලැබුනු මිල ලංසුව ද ඉතා ඉහළ අගයකින් යුක්ත වූ බැවින් සංස්ථාවේ එවකට ඒ සඳහා පැවති ප්‍රතිපාදනවල තත්ත්වය මත අදාල අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට යොමුවී නොමැත. | බොයිලේරුව නැවත භාවිතයට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු ආදායම සියයට 15ත් 20 ත් අතර ප්‍රමාණයකින් අහිමි වී තිබුණි. | | |
| (ඉ) | නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ශ්‍රේණිගත කිරීම් හා ඇසුරුම් කිරීමේ අංශයට 2021 වර්ෂයේ රු.8,100,000 ක් වැයකර විනාඩියකට පැකට් 60 ක් ඇසුරුම් කළ හැකි ස්වයංක්‍රීය ඇසුරුම් කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. 2022 වර්ෂය තුල ඇසුරුම් කරන ලද පැකට් ගණන 62,265ක් වී තිබුණු අතර මෙම යන්ත්‍රයෙන් උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඇසුරුම් යන්ත්‍රය මිලදී ගැනීමේදී පවත්නා පිරිසැකසුම් මධ්‍යස්ථාන වර්තමාන නිෂ්පාදන ධාරිතාවය සලකා නොමැත. අනාගතයේදී සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල නිෂ්පාදන ධාරිතාවයන් ඉහළ යාමේදී නිර්මාණය වන අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ද මෙහිදී අවධානය යොමු කර ඇත.එසේම සංස්ථාව පෙර සාපේක්ෂව වටිනාකමින් අඩු ඇසුරුම් යන්ත්‍රයක් මිලට ගැනීමට සැලසුම් කරන ලදුව, අදාල යන්ත්‍රයෙන් ලබාදෙන ඇසුරුම්වල නියැදි පරීක්ෂා කිරීමේදී ඒවායේ ඇසුරුම්වල බර සම්බන්ධයෙන් සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් එම යන්ත්‍රය මිලදී ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.එම පූර්ව අත්දැකීම් ද මෙම නවීන තාක්ෂණයෙන් යුතු ඇසුරුම් යන්ත්‍රය මිලදී ගැනීම සඳහා තීරණ ගැනීමේදී උපයෝගී කරගෙන ඇත. බාහිර පාර්ශවයන් සමඟ ද සාකච්ඡා කර ඇසුරුම්වල ගුණත්වය, ඇසුරුම් මිනුම්වල නිරවද්‍යතාවය, ඇසුරුම්වල ස්ථායිතාවය යනාදී කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර මෙහි සඳහන් පිරවිතරයන් සකස් කර ඇත. මෙම යන්ත්‍රයේ භාවිතය සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මූලික විමර්ශනයක් සිදුකරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී විෂයභාර අමාත්‍යාංශයේ උපදෙස් මත මෙම යන්ත්‍රයේ භාවිතය සම්බන්ධයෙන් අදාල තීරණ ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන කටයුතු ඵලදායීව හා අරපිරිමැසුම් දායක ලෙස කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන භාර නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීමට උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.15,653,000 ක මුදලක් වෙන් කර නිල නිවාස 07 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම නිල නිවාස භාවිතයට ගත හැකි ලෙස සම්පූර්ණයෙන් ඉදි කර අවසන්කොට නොතිබුණි. | මෙම නිල නිවාස සඳහා අනුමත ඇස්තමේන්තුවට සාපේක්ෂව වෙළෙඳපොලේ ඉදිකිරීම් ද්‍රව්‍ය මිල හා වැඩකුලී ඉහළ ගිය බැවින් අදාල ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය.විෂයභාර අමාත්‍යාංශ උපදෙස්,අනුමැතිය හා ප්‍රතිපාදන ලබාගෙන ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතින අතර,එම අනුමැතිය ලද වහාම මෙහි සඳහන් ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ හැකියාව පවතී. | ඉදිකිරීම් සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |